**State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning**

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper**

**අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**(ENTREPRENESHIP EDUCATION)**

**ව්‍යාවසායකත්ව අධ්‍යනය**

# (QUESTION PAPER) - II

# ප්‍රශ්න පත්‍රය - I I



අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

**අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

**ව්‍යවසායකත්ව අධ්‍යනය - II**

**අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

**11 ශ්‍රේණිය** **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න**

1. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මහරගම ප්‍රදේශයේ ඉතා ජනප්‍රිය ඇඟලුම් කර්මාන්තශාලාවක් වන "පැෂන් ගාමන්ට්" ආයතනයට පැමිණි 'තරිඳු' හා ඔහුගේ මිතුරෙකු වූ 'හසරැල්' පැෂන් ගාමන්ට් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ වන ප්‍රශාන් විසින් ඉතා සුහදශීලිව පිළිගත් අතර සුළු වේලාවකින් ඔවුන් ඉතා කුළුපග මිතුරන් විය. ඔවුන් ව්‍යාපාර කටයුතු පිළිබඳ ගැඹුරු කතාබහකට යොමු වූ අතර ප්‍රශාන් තමා ආ ගමන් මඟ තරිඳුට සහ හසරැල් ට විස්තර කරනු ලැබුවේ ගාම්බීර ලීලාවෙනි. ප්‍රශාන් දැක්වූ අදහස් වලට අනුව ඔහුගේ උපන් ගම ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වේ. පාසල් අවධියේදී ව්‍යාපාරයක් සාර්ථකව විධිමත් ආකාරයට පවත්වාගෙන යන ආකාරය පිළිබඳව හැදෑරූ ප්‍රශාන් අනාගතයේදී තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම පිළිබඳව සිහින දුටුවේය.

උසස් පෙළ A සාමාර්ථ තුනක් ලද ප්‍රශාන් ශ්‍රී ලංකාවේ පිහිටි ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයක 'පැෂන් ඩිසයින්' උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා ඇතුළුවිය. එහිදී ඔහු තම පාඨමාලාව ඉතා සාර්ථකව අවසන් කර ඉහළ සාමාර්ථයක් සහිතව උපාධිය ලබා ගන්නා ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතරතුර මුහුණ දුන් ආර්ථික ගැටලුව අවමකර ගැනීමටත්, තමා තුළ වූ ව්‍යාපාරික සිහිනය යථාර්ථයක් බවට පත්කර ගැනීමටත්, වටිනාකමෙන් අඩු කැබලි රෙදි පමුණුව ප්‍රදේශයේ වෙළඳුන්ගෙන් ලබාගෙන සිය මවගේ සහයෝගය ඇතිව බෙඩ් ෂීට්, කොට්ට උර, කොට කලිසම්, කමිස ආදී ඇඳුම් මසා කුඩා තොග වශයෙන් පළමුව ප්‍රදේශයේ සිල්ලර වෙළෙඳුන්ට අලෙවි කර ඇත. කෙටි කාලයක් තුළ ඔහු මසා නිම කළ ඇඳුම් සපයන්නෙකු ලෙස කුඩා පරිමාණ සිල්ලර වෙළඳුන් අතර ජනප්‍රිය විය. ප්‍රශාන් තම උපාධිය අවසන් කර පවතින ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කළේ මැෂින් කිහිපයක් හා සේවකයන් කිහිප දෙනෙකු යොදාගෙන නවීන විලාසිතා හා මෝස්තරවලින් සමන්විත නව නිර්මාණ වෙළඳපොළට ඉදිරිපත් කිරීමෙනි. මෙම ව්‍යාපාරය පැෂන් ගාර්මන්ට් ලෙසින් පවත්වාගෙන යන ලදී.

පැෂන් ගාර්මන්ට් ආයතනය සේවක සේවිකාවන් වැඩි පිරිසක් මහරගම ප්‍රදේශය අඩු ආදායම් ලබන පවුල් වලින් බඳවා ගෙන ඇත. සෑම වසරක් පාසාම ප්‍රදේශයේ දිළිඳු පවුල් 10 ක දරුවන් දස දෙනෙකුට අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම ප්‍රශාන්ගේ තවත් එක් කාර්යයක් විය. මීට අමතරව ව්‍යාපාර කටයුතු ක්‍රමවත් ආකාරයට පාලනය කළ ප්‍රශාන් රජයට ගෙවිය යුතු බදු මුදල් ද නිසි පරිදි ගෙවන ලදී.

(i). ප්‍රශාන් සාර්ථක ව්‍යාවසායකයකු බව තහවුරු කිරීම සඳහා කරුණු දෙකක් දක්වන්න.

(ii). ප්‍රශාන්ගෙ 'පැෂන් ගාමන්ට්' ව්‍යාපාරයේ ලියාපදිංචියට අදාල නීතිමය තත්ත්වය පැහැදිලි කරන්න.

(iii). ප්‍රශාන් විසින් ඉටුකරන ලබන සමාජයීය වගකීම් දෙකක් දක්වන්න.

(iv). සමාජ වගකීම් ඉටු කිරීමෙන් ප්‍රශාන්ගෙ ව්‍යාපාරයට ලැබෙන වාසි දෙකක් දක්වන්න.

(v). ප්‍රශාන්ගෙ ව්‍යවසායක කටයුතු තුළින් ඔහුට සහ දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ දෙක බැගින් දක්වන්න.

ඉහත සිද්ධියට අදාළ ප්‍රශාන්ගෙ ව්‍යාපාරයේ ඉදිරි මාස සඳහා වූ තොරතුරු කීපයක් පහත දැක්වේ.

| අයිතමය | වටිනාකම(රු:) |
|---|---|
| විකුණුම් ආදායම | 600,000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 100,000 |
| ශ්‍රම පිරිවැය | 50,000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 40,000 |
| පරිපාලන වියදම් | 35,000 |
| බැංකු ණය | 250,000 |
| විකුණුම් වියදම් | 25,000 |

ඉහත තොරතුරු ඇසුරෙන් ප්‍රශාන්ගේ ව්‍යාපාරයේ,

(vi).ඉදිරි මාසය සඳහා වූ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කරන්න.

(vii).ඉදිරි මාසය සඳහා වූ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

(viii).ඉදිරි මාස සඳහා වූ මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.

(ix).ඉදිරි මාසය සඳහා වූ ශුද්ධ ලාභය ගණනය කරන්න.

(x). මුදල් ගලා යාම සහ මුදල් ගලා ඒම සඳහා උදාහරණය බැගින් දෙන්න .

(ලකුණු 02 x 10 = 20)

2. (i).ව්‍යාපාරිකයෙකු සහ ව්‍යවසායකයෙකු අතර දැකිය හැකි සමානතා දෙකක් සහ වෙනස්කම් දෙකක් දක්වන්න.

(ii).ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි කළමනාකරුවන් වර්ග හතරක් දක්වන්න.

(iii).වර්තමාන සමාජය තුළ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග දෙකක් දක්වන්න.

(iv).කාන්තා ව්‍යවසායකයින් පොලඹවන ශක්තීන් හතරක් දක්වන්න.

(v). ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය සංවර්ධනය කළ යුතුය. මෙය තහවුරු කිරීමට හේතු හතරක් සඳහන් කරන්න.

(ලකුණු 02 x 5 = 10)

3.(i).වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම සඳහා ව්‍යවසායකයකු ට භාවිත කළ හැකි ක්‍රම හතරක් දක්වන්න.

(ii).ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ හතරක් දක්වන්න.

(iii). ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ හතරක් දක්වන්න.

(iv).දක්ෂ ව්‍යවසායකයෙකුගේ ලක්ෂණ හතරක් නම් කරන්න.

(v).මිනිස් අවශ්‍යතා දෙකක් හා ඒවා සපුරා ගන්නා උවමනා දෙක බැගින් නම් කරන්න.

(ලකුණු 02 x 5 = 10)

4. (i). ව්‍යවසායකයෙකු ට රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතු දෙකක් දක්වන්න.

(ii).හවුල් ව්‍යාපාරයක සීමා දෙකක් නම් කරන්න.

(iii).කේවල ස්වාමි හා හවුල් ව්‍යාපාර ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතු ලියවිලි දෙකක් නම් කරන්න.

(iv). ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වරලත් ව්‍යාපාර වර්ග දෙකක් නම් කරන්න

(v).ශ්‍රී ලංකාව තුළ සංස්කෘතික සමාගමක් ලියාපදිංචි කිරිම සඳහා යොදා ගන්නා පනත කුමක්ද?

(ලකුණු 02 x 5 = 10)

5. (i). ව්‍යවසායකයෙකු විසින් වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීමෙ අරමුණු හතරක් නම් කරන්න.

(ii).අලෙවි සැලසුමක් පිළියෙල කිරීම තුළින් ව්‍යවසායකයෙකු ට අත්කර ගත හැකි ප්‍රයෝජන හතරක් නම් කරන්න.

(iii). භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය සඳහා යොදාගත හැකි නව තාක්ෂණික ක්‍රමෝපායන් දෙකක් නම් කරන්න.

(iv).ව්‍යාපාර පරිසරය අධ්‍යයනය තුළින් ව්‍යවසායකයෙකු ට ළඟා කර ගත හැකි ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

(v).ව්‍යාපාරයක් ස්ථානගත කිරීමේදී සලකා බැලිය යුතු කරුණු හතරක් නම් කරන්න.

(ලකුණු 02 x 5 = 10)

6. (i). ව්‍යාපාර අදහසක් යනු කුමක්ද?

(ii).ව්‍යාපාර අදහසක් හා ව්‍යාපාර අවස්ථාවක් අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් නම් කරන්න.

(iii).අලෙවි මිශ්‍රය ප්‍රධාන විචල්‍යයන් හතර නම් කරන්න.

(iv)නව ව්‍යවසායකයෙකු වෙලඳ පොලට ප්‍රවේශ වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් නම් කරන්න.

(v). ව්‍යාපාරයක සමාජ වගකීම් හතරක් නම් කරන්න. (ලකුණු 02 x 5 = 10)

7. අමරජීව මහතා තනි පුද්ගල ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන අතර ඔහුගේ ව්‍යාපාර ව්‍යාපාර සැලසුමෙන් 2021 වර්ෂය සඳහා යොදා ගන්නා ලද තොරතුරු පහත දැක්වේ.

| | රු: |
|---|---|
| අයිතිකරු යෙදවූ ප්‍රාග්ධනය | 750,000 |
| බැංකු ණය | 500,000 |
| අපේක්ෂිත විකුණුම් (අත්පිට මුදලට) | 800,000 |
| අපේක්ෂිත විකුණුම් (ණයට) | 500,000 |
| ණයගැති ලැබීම් | 350,000 |
| ණය වාරික ගෙවීම් | 50,000 |
| පරිපාලන වියදම් | 80,000 |
| විකිණීම සඳහා භාණ්ඩ මිලට ගැනීම | 600,000 |
| විකුණුම් වියදම් | 60,000 |
| මූල්‍ය හා වෙනත් වියදම් | 40,000 |
| උපකරණ මිලදී ගැනීම් | 250,000 |

අවශ්‍ය වන්නේ,

(i). 2021 වර්ෂය සඳහා අමරජීව ගේ ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ලකුණු 06)

(ii). 2021 වසර අවසානයේ අමරජීව ගේ ව්‍යාපාරයෙ මුදල් ශේෂය (ලකුණු 02)

(iii).අමරජීව ආරම්භ කිරීමට අපේක්ෂා කරන තනිපුද්ගල ව්‍යාපාරයක මූලික ලක්ෂණ හතරක් දක්වන්න.

(ලකුණු 02) (මුළු ලකුණු 10)